40

# රාගාංග අනුව හින්දුස්තානී රාග වර්ගීකරණය

**එච්. ජී. ඩී. පී. හපුතන්ත්‍රී [1]**
HU/2012/0843

රාගාංග අනුව හින්දුස්තානි රාග වර්ගීකරණය මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වේ. හින්දුස්තානි සංගීතයේ ප්‍රධාන වශයෙන් රාග වර්ගීකරණයට ලක් වී ඇත්තේ භාත්ඛණ්ඩේ පඬිතුමාගේ "දශථාට" සිද්ධාන්තයට අනුව යි. පසුකාලීන ව නවීන රාග බිහිවීමත් සමඟ "දශථාට" සිද්ධාන්තයේ දුර්වලතා පෙන්වා දුන් පණ්ඩිත් විශ්ණු දිගම්බර් පලුෂ්කාර්ගේ ප්‍රධාන ගෝලයෙකු වන නාරායන් මෝරේෂ්වර් ඛරේ පඬිතුමා (ග්වාලියර් ගරාණා) විසින් 1950 වර්ෂයේදී හින්දුස්තානි සංගීතයට රාගාංග වර්ගීකරණ සිද්ධාන්තය හඳුන්වා දෙන ලදී. සියුම් වෙනස්කම් දනවන  මහා පරිමාණයක රාග සංඛ්‍යාවක් අතරින් පැහැදිලි ලෙස ම රාගයකින් රාගයක් වෙන් කර හඳුනාගත හැකි රාගයකට ආවේණික පොදු ස්වර සංගතියක් මෙහිදී හඳුන්වා දෙන ලදී. ඒ අනුව මෙහිදී කල්‍යාණ, බිලාවල්, භෛරව, තෝඩි, කේදාර්, බිහාග්, සාරංග, කෞන්ස්, මල්ලාර්, කානඩා, කාෆි, ඛමාජ්, පූර්වි, නට්, සහ ගෞඩ යන රාගාංග 15ක් පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි. විශේෂයෙන්ම හින්දුස්තානී සංගීතය හදාරන ආධුනිකයන්ට රාගයක් ගායනය හෝ වාදනය කිරීමේදී ඇතිවන ප්‍රායෝගික ගැටළු අවම කරමින් අදාළ රාගය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇතිකර ගැනීමට මෙම රාගාංග බොහෝ සෙයින් වැදගත් වේ. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස ලිඛිත මූලාශ්‍ර, ශ්‍රව්‍ය-දෘශ්‍ය මූලාශ්‍ර, සහ පූර්ව පර්යේෂකයන් විසින් කරන ලද පර්යේෂණ උපයෝගී කරගන්නා ලදී.

ප්‍රමුඛ පදඃ හින්දුස්තානි සංගීතය, රාග, රාගාංග

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර*